# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 788 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 09/05/2024<br>පැය 1415 |

## මාධ්‍ය නිවේදනය

**ප්‍රාණ ඇපයේ සිටි දරුවන් මුදා ගැනීම සඳහා දායක වූ පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් හට පොලිස්පති ප්‍රශංසා සහ ත්‍යාග ප්‍රදානය කිරීම.**

2024.05.05 වන දින හංවැල්ල පොලිස් වසමේ ජල්තර නිවාස සංකීර්ණය තුළ පවුල් ආරවුලක් මත දරුවන් දෙදෙනකු ප්‍රාණ ඇපයට තබා ගනිමින් බෝම්බයක් පුපුරුවා ගැනීමට තැත් කරන ලද පුද්ගලයෙක් පිළිබඳ ලද තොරතුරක් මත පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් විශේෂ මෙහෙයුමක් ආරම්භ කරන ලද අතර එහිදී පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් පරීක්ෂා කරන ලද අවස්ථාවේ එම ජීව අත්බෝම්බයේ ආරක්ෂිත අගුල ඉවත් කර ඇති බවද නිරීක්ෂණය වී ඇත. එම අවස්ථාවේදී තම ජීවිත අවදානම ගැනද නොතකමින් පොලිස් විශේෂ කාර්ය බලකා නිලධරීන් විසින් කිසිදු දේපල හෝ ජීවිත හානියක් සිදු වීමට ඉඩ නොදී ප්‍රාණ ඇපයේ සිටි දරුවන් දෙදෙනා මුදා ගනිමින් සිදු කල සේවය අගයමින් ඔවුන්ට පොලිස්පති ප්‍රශංසා සහ ත්‍යාග ප්‍රදානය කිරීමේ උත්සවයක් 2024.05.09 වන අද දින ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මහතාගේ ප්‍රදානත්වයෙන් මහජන ආරක්ෂක අමාත්‍යංශයේදී පැවැත්විණි.

මෙම අවස්ථාවට පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා, පොලිස් විශේෂ කාර්ය බලකායේ අණදෙන නිලධාරී වරුණ ජයසුන්දර මහතා සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අපරාධ හා රථවාහන රන්මල් කොඩිතුවක්කු මතාගේ සහභාගීත්වයෙන් පැවති මෙම උත්සවයේදී නියෝජ්‍ය පොලිස්පති එම්.කේ.බී.එස්.එන්. ගුණරත්න මහතා සහ පොලිස් අධිකාරි වී.ජී.ඩී.එස්. සමරනායක මහතා ඇතුළු නිලධාරී 09 දෙනෙකු වෙනුවෙන් පොලිස් ත්‍යාග අරමුදලින් රුපියල් 750,000 /= ක් සහ පොලිස්පති ප්‍රශංසා 02ක් පිරිනමන ලදි.

මෙම අවසථාවට අදාළ ඡායාරූප කිහිපයක්









මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය,
පොලිස් මාධ්‍ය කොට්ඨාසය.